**චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතිය - (අදියර II) 2015**

-----------------------------------------------------------------------------------------------------------

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතියේ - (අදියර II) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන සංවර්ධන බැංකු (CDB) සංස්ථාව අතර 2014 නොවැම්බර් 24 දින එළඹි අංක 4510201401100000587 දරන ණය පහසුකම් ගිණුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ආරම්භක අරමුණ වූයේ තීරණාත්මක ප්‍රවේශතාවයක් සපයන දකුණු පළාතේ ජාතික හා පළාත් මාර්ග 10 ක කිලෝමීටර් 105 ක් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රදේශයේ ජීවත්වන ජනතාව සඳහා සමාජ හා ආර්ථික ප්‍රතිලාභ සැලසීමයි. කෙසේ වුවද, පසුව මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ජාතික මාර්ග 9 ක කිලෝ මීටර් 80.60 ක් සහ මහනුවර දිස්ත්‍රික්කයේ වෙනත් ග්‍රාමීය මාර්ග 11 ක කිලෝ මීටර් 48.25 ක් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියේ වැඩ විෂය පථය යළි සැලසුම් කරන ලදි. ණය පහසුකම් ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,594.14 කට සමාන එජඩො මිලියන 117.66 ක් වන අතර ඉන් රු.මිලියන 13,253 කට සමාන එජඩො මිලියන 100 ක් සැපයීම සඳහා චීන සංවර්ධන බැංකු සංස්ථාව එකඟවී තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

-----------------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව, 2016 මාර්තු 31 ට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 නොවැම්බර් 02 දිනදීය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

------------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

-------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත පළමු ගිණුම් වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| චීන සංවර්ධන බැංකු සංස්ථාව | 100.00 | 13,253.00 | - | - | - |
| ශ්‍රීලංර | 17.66 | 2,341.14 | 25.50 | - | 22.81 |
| එකතුව | 117.66 | 15,594.14 | 25.50 | - | 22.81 |

**3.2 භෞතික ප්‍රගතිය**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, දකුණු පළාතේ ජාතික හා පළාත් මාර්ග 10 ක කිලෝ මීටර් 105 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා චීන සංවර්ධන බැංකු සංස්ථාව සමඟ 2013 මැයි 28 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එබැවින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය - මිද්දෙණිය මාර්ගයේ කිලෝ මීටර් 12.87 ක හා තංගල්ල - වීරකැටිය මාර්ගයේ කිලෝමීටර් 14.48 ක පුනරුත්ථාපන වැඩ 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, එම මාර්ග වල පුනරුත්ථාපන වැඩ නතර කිරීමට 2015 ජුනි 17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. පසුව වැඩ වල විෂය පථය වෙනස් කර මහනුවර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ජාතික මාර්ග 09 ක කිලෝමීටර් 80.6 ක් හා මහනුවර දිස්ත්‍රික්කයේ වෙනත් ග්‍රාමීය මාර්ග 11 ක කිලෝ මීටර් 48.25 ක් පුනරුත්ථාපනය කිරීමට 2016 අප්‍රේල් 20 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය

කර තිබුණි. කෙසේ වුවද, එම මාර්ගවල පුනරුත්ථාපන වැඩ 2016 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කාර්යයන් වරින් වර වෙනස් කර තිබූ බවට සාක්ෂි දරයි. එබැවින් රටේ යහපත සඳහා කාලීන ආකාරයෙන් ණය මුදල් උපයෝජනය කිරීම පිළිබඳ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) වාර්තාවේ ඉහත ජේදයේ සඳහන් කර ඇති පරිදි 2014 වර්ෂයේදී තංගල්ල - වීරකැටිය මාර්ගය හා වීරකැටිය - මිද්දෙණිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා විදේශ සමාගමකට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු 2015 ජුනි මාසයේදී නතර කර තිබුණි. එබැවින් තංගල්ල - වීරකැටිය මාර්ගයේ කිලෝමීටර් 14.48 කින් කිලෝමීටර් 1.96 ක පුනරුත්ථාපන වැඩ නිම කිරීමට හැකි වී තිබූ අතර රු.මිලියන 163 ක මුදලක් ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**3.3 පරිබාහිර වියදම්**

**------------------**

හම්බන්තොට පැවැත්වීමට සැලසුම් කර ගෙන තිබූ යෝජිත ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව දකුණු පළාතේ සියලු මාර්ග පුනරුත්ථාපන වැඩ 2014 වර්ෂයේදී සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් තංගල්ල - වීරකැටිය මාර්ගය හා වීරකැටිය - මිද්දෙණිය මාර්ගයේ පුනරුත්ථාපන වැඩ පිළිබඳ අතිරේක කාර්යයන්ද අදාළ පාර්ශවයන්ගෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් රු.මිලියන 72.61 ක පිරිවැයකට සිදුකර තිබුණි. 2014 වර්ෂයේ ජාතික නිදහස් දින උත්සවය වෙනත් ස්ථානයක පැවත්වීම හේතුවෙන් අතිරේක මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා දරන ලද පිරිවැය ඵල රහිත වී ඇති බව නිරීක්ෂණය විය.